**ආබාධ සහිත ශිෂ්‍යයන් සඳහා විභාග මාර්ගෝපදේශ - දෙවැනි සෙමෙස්තරය 2019/2020**

**ශාස්ත්‍ර පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය**

- ආබාධසහිත සියලුම ශිෂ්‍යයන්ට මාර්ගගත විභාගය සඳහා මුහුණදීම හෝ ශාස්ත්‍ර පීඨයට පැමිණ ලබා දී ඇති පහසුකම් භාවිත කරමින් විභාගයට මුහුණදීම සිදුකළ හැකිය.
- ආබාධ සහිත ශිෂ්‍යයන් සඳහා පවතින මාර්ගගත විභාගය හෝ පීඨයට පැමිණ විභාගය සඳහා පෙනී සිටීම සඳහා අතිරේක කාලයක් බාරදීම/ලියාපදිංචි තැපෑලෙන් එවීම සඳහා ලැබෙනු ඇත. පිළිතුරු පත්‍ර එවිය යුත්තේ නියෝජ්‍ය ලේඛාධිකාරි, ශාස්ත්‍ර පීඨය වෙතටය. ආබාධ සහිත ශිෂ්‍යයන් තම පිළිතුරු පත්‍ර භාරදීම/ලියාපදිංචි තැපෑලෙන් එවීම විභාගයෙන් පසු එළඹෙන සතියේ බදාදා දින එවිය යුතුය. නිදසුනක් ලෙස, ඔබට 2021 පෙබරවාරි 15 සිට 2021 පෙබරවාරි 19 දක්වා විභාග තිබේ නම් එම සතියේ දී සම්පූර්ණ කරන ලද සියලුම පිළිතුරු පිටපත් 2021 පෙබරවාරි 24 වන විට නියෝජ්‍ය ලේකාධිකාරි, ශාස්ත්‍ර පීඨය වෙතට ලැබෙන ලෙස භාරදීම/ ලියාපදිංචි තැපෑලෙන් එවීම සිදු කල යුතුය.
- යම් ශිෂ්‍යයෙකු විභාගයට ශාස්ත්‍ර පීඨයේ සිට මුහුණදීමට කැමති නම් ඔවුන් CEDREP කාර්යාලයට වැඩකරන දිනවල උදෑසන 09 සිට 04 දක්වා කාලය තුළ 011 2580835 හා සම්බන්ධ වෙමින් සිය ඉල්ලීම ඉදිරිපත් කළ යුතුය. විභාග කාලය අතරතුර ශිෂ්‍යයන්ට අත්‍යවශ්‍ය වන පහසුකම් (කියවන්නෙකු, ලියන්නෙකු, තාක්ෂණික සහයකයෙකු) සම්බන්ධයෙන් ද එහිදි දැනුවත් කළ යුතුය. නේවාසිකාගාර පහසුකම් අවශ්‍ය ශිෂ්‍යයන් සඳහා නේවාසික පහසුකම් සහ නේවාසිකාගාරයේ සිට විශ්වවිද්‍යාලටත්, නැවත විශ්වවිද්‍යාලයේ සිට නේවාසිකාගාරය වෙත යැවීමට පහසුකම් සපයනු ඇත.
- යම් ශිෂ්‍යයෙකු නිවසේ සිට විභාගය සඳහා මුහුණ දෙන්නේ නම් ඔවුනට සිය පිළිතුරු පත්‍ර අදාළ විද්‍යුත් තැපැල් ලිපිනය වෙත ඊ-මේල් කළ හැකිය. ඊ-මේල් එවීමේදී අදාළ විෂය ඒකකයේ අංකය සහ තම ශිෂ්‍ය ලියාපදිංචි අංකය මාතෘකා තිරුවෙහි (subject section) යොදන්න.

| | |
|---|---|
| 1st Year | exam1@arts.cmb.ac.lk |
| 2nd Year | exam2@arts.cmb.ac.lk |
| 3rd Year | exam3@arts.cmb.ac.lk |
| 4th Year | exam4@arts.cmb.ac.lk |

- **ඊ-මේල් නොකරන්නේ නම් ඔවුනට සිය පිළිතුරු පත්‍රයන්හී පිටපතක් තමා ළඟ තබාගනිමින්, පිටපතෙහි මුල් පිටපත නියෝජ්‍ය ලේඛාධිකාරී වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.**

**නියෝජ්‍ය ලේඛාධිකාරි,**
**ශාස්ත්‍ර පීඨය,**
**කොළඹ විශ්වවිද්‍යාලය, කොළඹ 03**

- යම් ශිෂ්‍යයකු බ්‍රේල් උපකරණය, බ්‍රේල යතුරු පුවරුව භාවිත කරන්නේ නම් ඔවුන් සිය **පිළිතුරු පත්‍රයන්හී අනුපිටපතක් තමා ළඟ තබාගනිමින් අනෙක් පිටපත ඉහත ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.**
- ශිෂ්‍යයන් සිය විෂය අංකය (FND 1201) තැපැල් කිරීමේදී ලියුම් කවරයෙහි වම් පස ඉහළ කෙළවරෙහි සඳහන් කළ යුතුය.
- **සෑම ප්‍රශ්න පත්‍රයක් සඳහාම වූ අදාළ පිළිතුරු පත්‍ර වෙනම ලියුම් කවරයක් භාවිත කරමින් ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.**
- ආබාධ සහිත සියලුම ශිෂ්‍යයන් LMS හරහා ලබා දී ඇති සිය ප්‍රකාශන පෝරමය/ පොදු ඉදිරිපස පිටුව සම්පූර්ණ කර අදාල LMS විෂය පිටුවට භාරදිය යුතුය. එහිදී අදාළ ප්‍රශ්න පත්‍රය ලබාදීමෙන් අනතුරුව පැය 24ක් ඇතුළත විභාගය සඳහා සිය පැමිණීම තහවුරු කිරීම සඳහා භාරදිය යුතුය. යම් තාක්ෂණික අපහසුතා ඇත්නම් ශිෂ්‍යයන් සිය ප්‍රකාශනය පෝරමය/පොදු ඉදිරිපස පිටුව අදාල ඊමේල් ලිපිනය වෙත එවිය යුතුය.